# සිංහල පරිවර්තනය

## උතුරු පළාත් දෙමළ හා සිංහල භාෂා මාධ්‍ය මගින් වූ පාසල් වල ප්‍රාථමික අධ්‍යාපනය (ඉංග්‍රීසි) ගුරු තනතුරට පවතින පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 වන පන්තිය I (ඇ) ශ්‍රේණියට ඉංග්‍රීසි ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය– 2021

උතුරු පළාත් පාසල්වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ 3වන පන්තිය 1(ඇ) ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු සඳහා **ඉංග්‍රීසි ඩිප්ලෝමාධාරීන් (පහත සඳහා වගුවේ සඳහන් පරිදි)** බඳවා ගැනීම සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය ***26.07.2021*** වේ.

| අංක | විෂය | 3 වන පන්තිය I (ඇ) | | සම්පූර්ණ ගණන |
|---|---|---|---|---|
| | | දෙමළ මාධ්‍ය මගින් | සිංහල මාධ්‍ය මගින් | |
| *01* | **ඉංග්‍රීසි (ප්‍රාථමික අධ්‍යාපනය)** | **97** | **11** | **108** |

## *02.* බඳවා ගැනීමේ සේවා කොන්දේසි

2.1 **අංක 1885/38** දරණ *2014.10.23* වන දින දරණ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අතිවිශේෂිත ගැසට් නිවේදනයේ පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය මගින් නිර්දේශිත කොන්දේසින් හා ආයතන සංග්‍රහයේ විධිවිධාන හා මුදල් රෙගුලාසින්, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක **1817/30** දරණ *2013.07.03* වන දිනැතිව අතිවිශේෂිත ගැසට් නිවේදනයේ පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවයට අදාළ ආයතන කාර්ය පටිපාටි සංග්‍රහය යනාදීන්ට අනුකූලව, තෝරා ගන්නා අපේක්ෂකයන් අදාළ තනතුරේ 3වන පන්තිය 1(ඇ) ශ්‍රේණියට පත් කරනු ලැබේ.

2.2 උක්ත විභාගය මගින් තෝරා ගන්නා අපෙක්ෂකයන් පත්වීම් ලබන දින සිට වසර තුනකට පරිවාස කාලපරිච්ඡේදයකට යටත් කර පත් කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරකි.

2.3 මෙම සේවය ස්ථාන මාරුවලට යටත් වූ සේවයකි. එබැවින් මෙම නියෝගය යටතේ පත්වීම ලබා ගන්නා අපෙක්ෂකයන් උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුයි.

2.4 පත්වීම් සංඛ්‍යාව හා එය ක්‍රියාත්මක වන දිනය වැනි කරුණු යනාදිය පත්වීම් බලධාරියා විසින් නිර්වචනය කරනු ලැබේ. නිවේදනය කරන ලද යම් පුරප්පාඩුන් හෝ පුරප්පාඩු සියල්ල සම්පූර්ණ නොකර සිටීමේ බලතල පත්වීම් බලධාරියා සතුය.

## *03.* වැටුප් පරිමාණය

3වන පන්තිය 1(ඇ) ශ්‍රේණියේ තනතුරට අලුතින් බඳවා ගනු ලබන ගුරු භවතෙක් පත්වීම ක්‍රියාත්මක වන දින සිට අංක *03/2016* දරණ *2016.02.25* වන දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුකූලව, **GE 1-2016** යන වැටුප් සංකේතයේ **රුපියල් 27,740 – 6 x 300 – 7 x 380 – 2 x 445 – 33,090** මාසික වැටුප් පරිමාණයෙන්, I වන වගුවේ සඳහන් පරිදි 7 වන වැටුප් පියවර වන රුපියල් *29,540/-* හි පිහිටුවනු ලබයි. ඊට අමතරව රජය විසින් රාජ්‍ය නිලධාරීන් සඳහා කලින් කලට ගෙවීම් කරන දීමනාද ඔවුන්ට හිමිවේ.

## *04.* සාමාන්‍ය සුදුසුකම්

04.1 අයදුම්කරුවන් ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතුයි.

04.2 **(දෙමළ මාධ්‍යය මගින් වූ අයදුම්කරුවන්ට පමණයි)** අයදුම්කරුවන්ගේ ස්ථිර පදිංචිය උතුරු පළාත විය යුතුයි. මෙම අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ප්‍රථමයෙන් වූ වසර හයක *(06)* කාල පරිච්ඡේදයෙන් අවම වශයෙන් වසරක තුනත්*(03)* හෝ උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවන් විය යුතුයි.

**හෝ**

අයදුම්කරුවන් හෝ දෙමාපියන් උතුරු පළාතේ උපන් අය විය යුතුයි. අවම වශයෙන් අවුරුදු පහක් (05) ක් උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවන් විය යුතුයි. **(*සම්මුඛ පරීක්ෂණයේ දී ස්ථිර පදිංචි සනාථ කිරීමට ඡන්ද නාම ලේඛනයේ උපුටනයක් ඉදිරිපත් කළ යුතුයි)**

04.3 අයදුම්කරුවන් උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකි වන පරිදි ශාරීරික යෝග්‍යතාවයකින් සිටිය යුතුයි එමෙන්ම මනා චරිත.වත් පුද්ගලයකු ද විය යුතුයි.

04.4 අයදුම්කරුවන් අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට හෝ ඊට ප්‍රථම **සියලුම සුදුසුකම්** සපුරා තිබිය යුතුයි.

**04.5 වයස් සීමාව**

අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට අයදුම්කරුවන්ගේ **වයස අවුරුදු *18* ට නොඅඩු, වයස අවුරුදු *44* ට නොවැඩි විය** යුතුයි.

## *05.* අධ්‍යාපන සුදුසුකම්

*05.1* පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා නොවන රේඛිය අධ්‍යාපන අමාත්‍යාංශයෙන් අනුමත කරන ලද ආයතනයකින් ප්‍රදානය කරන ලද අවුරුදු දෙකක නොඅඩු පාඨමාලාව කාලසීමාවක් සහිත ජාතික වෘත්තිය සුදුසුකම් මට්ටම හයට(6) නොඅඩු ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කරන ලද සහතිකය ලබා තිබිය යුතුයි.

*05.2* ඡේද ***05.01* හි** සඳහන් සුදුසුකම් සමග අ.පො.ස(සා/පෙ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමත්වී තිබිය යුතුයි.

## *06.* බඳවා ගැනීමේ ක්‍රමය

*06.1* තරග විභාගයෙන් එක් එක් ප්‍රශ්න පත්‍රවලටම අවම වශයෙන් ලකුණු *40%*ක් ලබාගන්නා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී අදාළ තනතුරට කැඳවන ලද සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. එමෙන්ම සම්මුඛ පරීක්ෂණයේදී මේ සඳහා ලකුණු කිසිවක් ප්‍රදානය කරනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී සුදුසුකම් සපුරනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලැබේ. ***11.2*හි සඳහන් පරිදි** ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු ප්‍රදානය කරනු ලැබේ. ප්‍රායෝගික පරීක්ෂණය, ලිඛිත පරීක්ෂණය යන පරීක්ෂණයන් දෙකටම ලබාගත් සම්පූර්ණ ලකුණුවල එකතුවේ ඉහළ ලකුණු අනුපිළිවෙළ (Merit Order) සැලකිල්ලට ගෙන පාසල පදනම් කොට විධිමත් පරිදි පවතින පුරප්පාඩුවලට පත්වීම් ප්‍රදානය කරනු ලැබේ.

*06.2* සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන් වෙත අදාළ පුරප්පාඩු ලැයිස්තුව ප්‍රදර්ශනය කරනු ලැබේ. ඊට අනුකූලව එම අවස්ථාවේදී අයදුම්කරුවන් විසින් පුරප්පාඩු දක්නට ලැබෙන පාසල් වලට පත්වීම් ලැබීම සඳහා තම මනාපය අනුපිළිවෙලින් පළ කළ යුතුයි

**සටහන :-** එකම පාසලට අයදුම්කර ඇති බොහෝ අයදුම්කරුවන් අතුරින් වැඩි ප්‍රමාණයක් සම ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා අවස්ථාවේදී අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලේකම්වරයා විසින් විධිමත් ක්‍රමයකට අයදුම්කරුවන් තෝරා ගෙන පාසල තෝරා ගැනීම සඳහා කටයුතු කරනු ලැබේ. මේ හා සම්බන්ධයෙන් අයදුම්කරුවන් විසින් කිසිදු ඉල්ලීමක් ඉදිරිපත් කළ නොහැකිය.

*06.3* පත් කරන පාසල සම්බන්ධයෙන් පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන ඕනෑම තීරණයක් සඳහාම අයදුම්කරුවන් යටත් විය යුතුයි. ඒ හා සම්බන්ධව කිසිදු අභියාචනාවක් අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කළ නොහැකිය.

*06.4* පුරප්පාඩු වලින් *03%*ක් ආබාධිතයන් වෙනුවෙන් වෙන් කරනු ලැබේ. එම අපේක්ෂක පත්වීම සඳහා තෝරා ගන්නා විට අදාළ තනතුරේ සේවය කිරීම සඳහා තම ශාරීරික/මානසික සුදුසුකම් බාධාවක් නොවන බව විශේෂිත වෛද්‍ය පරීක්ෂණය මගින් ඔප්පු කළ යුතුයි.

## *07.* විභාග ගාස්තු

රුපියල් ***500.00*** ක් වටිනා මුදල තැපැල් කාර්යාලයක ගෙවා, මුදල් ඇණවුඹ **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත"** යන නමට **යාපනය තැපැල් කාර්යාලයෙන්** මාරු කරගත හැකිවන පරිදි මුදල් ඇණවුම ලබාගෙන එම කුවිතාන්සිය අයදුම්පතේ නොගැලවෙන පරිදි අලවා යොමු කළ යුතුයි. කුමණ හේතුවක් නිසා හෝ මෙම ගාස්තුව නැවත ගෙවනු නොලැබේ. එමෙන් ම මෙම ගාස්තුව වෙනත් කිසිදු විභාගයක් සඳහා මාරු කිරීමට ද අනුමත කරනු නොලැබේ.

## *08.* අයදුම්කිරීමේ ක්‍රමය

*08.1* මෙම දැන්වීම අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව A4 ප්‍රමාණයෙන් යුත් (සෙ.මී*21.*x සෙ.මී *29*) කඩදාසියේ *1* සිට *10* දක්වා වූ ඡේද පළමු කොටසේ ද ඉතිරි කොටස් අනෙක් පිටුවටද ඇතුළත් වන පරිදි අයදුම්පත්‍රය සකස් කළ යුතුයි. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය **26.07.2021** වන දින හෝ ඊට ප්‍රථම ලබා ගත හැකි පරිදි," **ලේකම්, පළාත් රාජ්‍ය සේවා**

**කොමිෂන් සභාව, උතුරු පළාත, අංක:393/48, කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යොමු කළ යුතුයි.

*08.2* අයදුම්පත්‍රයේ *01* යටතේ අයදුම්කරුගේ නම සඳහන් කරන විට සම්පූර්ණ නමේ අවසාන නම පළමුවෙන් සඳහන් කර ඉන් අනතුරුව ඉතිරි නම් වල මුලකුරු අගට යොදා නම සඳහන් කළ යුතුයි. **උදා** :- අයදුම්පත්‍රයේ *01* කොටසෙහි නම KUMAR.K.S යනුවෙන් සඳහන් කළ යුතුයි.

අයදුම්පත්‍රය යොමු කරන ලිපි කවරයේ වම් උඩ කෙළවරේ **ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 වන පන්තිය I (ඇ) ශ්‍රේණියට ඉංග්‍රීසි ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය– 2021"** යනුවෙන් සඳහන් කළ යුතුයි.

*08.3* අයදුම්පත්‍රයේ **ඡායා පිටපතක්** තම භාරයේ තබා ගැනීමට ප්‍රයෝජනවත් විය හැකියි. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් හෝ පූර්ව නිශ්චිත පිටපත් භාර ගනු නොලැබේ. විභාග ප්‍රවේශ පත්‍ර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් නිකුත් කරනු ලැබේ. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම යනු අයදුම්කරුවන් සියලුම සුදුසුකම් සපුරා ඇති බවට අදහස් කිරමක් නොවන බව සැලකිය යුතුයි.

*08.4* අයදුමපත් යොමු කරන අයදුම්කරුවන් හට විභාග දිනයට අවම වශයෙන් දින තුනකට (03) කට පෙරාතුව හෝ කිසියම් අයදුම්කරුවෙකුට විභාග ප්‍රවේශපත්‍ර නොලැබුණේ නම් පහත සඳහන් තොරතුරු සමග **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක:393/48, කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට දැන්විය යුතුයි. . (දුරකථන අංකය -021 221 9939, ෆැක්ස් අංකය -021 221 9940)

**සම්බන්ධ වන විට ඉදිරිපත් කළ යුතු තොරතුරු :-**
විස්තර සඳහන් ලිපියක්, අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් හා විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සියේ පිටපත, ප්‍රවේශ පත්‍රය යොමු කිරීමට අවශ්‍ය ෆැක්ස් අංකයක්.

*08.5* **සෑම අයදුම්කරුවෙකු විසින් ම තම අත්සන සහතික කර ගැනීම අත්‍යාවශ්‍ය වේ.** එක් රජයේ ආයතනයක් මගින් අයදුම් කරන අයදුම්කරුවෙකු වේ නම් තම ආයතන ප්‍රධානියා හෝ ඔහු වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු මගින් සහතික කර ගත යුතුයි. අනෙක් අයදුම්කරුවන් විසින් තම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී, සාම විනිසුරු, දිවුරුම් ප්‍රකාශක නිලධාරී, නීතිඥ, නොතාරිස්වරයෙකු, නාවික හමුදාව, යුදහමුදාව, ගුවන් හමුදාව යනාදියෙහි අණ ලැබූ නිලධාරියෙකු, රුපියල් *498,960.00* ට නොඅඩු වටිනාකමින් යුත් වාර්ෂික ඒකාබද්ධ වැටුපක් වශයෙන් ලබන්නා වූ ස්ථිර රජයේ හෝ පළාත් පාලන හෝ පළාත් සභා නිලධාරියෙකු, ආගමික නිකායන් භාර ආගමික නායකයන් වැනි අයගෙන් කෙනෙකු සහතික කළ යුතුයි.

## *09.* අනන්‍යතාවය ඔප්පු කිරීම

අපෙක්ෂකයන් තමන් පෙනී සිටින සියළුම විෂයයන් සඳහා විභාග ශාලා අධීක්ෂණ නිලධාරී තෘප්තිමත් වන පරිදි තම අනන්‍යතාවය සනාථ කළ යුතුයි. අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් කුමක් හෝ එකක් පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
(ii) වලංගු ගුවන් ගමන් බලපත්‍රය.
(iii) වලංගු රියදුරු බලපත්‍රය.

ඉහත සඳහන් ලියකියවිලි වලින් එකක් හෝ විභාගයට පෙනී සිටින විට ඉදිරිපත් කිරීමට අපොහොසත් වන විභාග අපේක්ෂකයෙකුගේ අපේක්ෂකත්වය **"උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභවේ ලේකම්වරයාගේ"** අභිමතය පරිදි ප්‍රතික්ෂේප කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභවේ ලේකම්වරයා විසින් පනවනු ලබන නීතිරීතින්ට අනුකූලව කටයුතු කිරීමට නැඹුරුවිය යුතුයි.

## *10.* සාවද්‍ය තොරතුරු සඳහා දඬුවම්

අයදුම්පත්‍ර සම්පූර්ණ කරන විට අවධානයකින් යුතුව නිවැරදි තොරතුරු සැපයීමට වගබලා ගත යුතුයි. මෙම විභාග රීතීන්ට අනුව කිසියම් අයදුම්කරුවෙකු විභාගයට ප්‍රථමයෙන් හෝ විභාගයට පසුව හෝ කුමණ හෝ අවස්ථාවකදී හෝ සුදුසුකම් සපුරා නැති බවට අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය සඳහා ඇති හිමිකම් සියල්ල අහෝසි කරනු ලැබේ. එමෙන් ම අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද කිසියම් තොරතුරක් සාවද්‍ය තොරතුරු බව අනාවරණ වන කුමණ අවස්ථාවකදී හෝ පළාත් රාජ්‍ය සේවයෙන් නෙරපා හැරීමට ඉඩකඩ ඇත.

## 11. විභාග සැලැස්ම

### 11.1 ලිඛිත විභාගය

මෙම විභාගයට පහත සඳහන් පරිදි ප්‍රශ්න පත්‍ර දෙකකින් (02) සමන්විත වේ. සිංහල හා දෙමළ භාෂා මාධ්‍යයන්ගෙන් මෙම විභාගය පැවැත්වීමට නියමිත බැවින් අයදුම් කළ භාෂාව පසුව වෙනස් කිරීමට අවකාශය දෙනු නොලැබේ

| අංක | ප්‍රශ්න පත්‍රය | විෂය මාලාව | වෙලාව | ලකුණු |
|---|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | ගුරු වෘත්තිය සඳහා විභාග අපේක්ෂකයන් තුළ ඇති කුසලතා තර්කාණුකූලව ඇති දැනුම සම්බන්ධයෙන් අගය කිරීමේ අරමුණින් මෙම ප්‍රශ්ණපත්‍ර සකස් කරනු ලැබේ. මේ සඳහා බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමට හැකි වන පරිදි ප්‍රශ්න 50 කින් සමන්විත වන අතරම සියළුම ප්‍රශ්න වලට පිළිතුරු කෙටියෙන් ඉදිරිපත් කළ යුතුයි. | පැය 01 | 100 |
| 02 | සාමාන්‍ය දැනුම | විභාග අපෙක්ෂකයෙන් තුළ ගුරු ක්ෂෙත්‍රයට අදාළව හා එම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් දක්නට ලැබෙන සාමාන්‍ය දැනුම හෝ අභ්‍යන්තර වශයෙන් පැන නැගී ඇති හෝ පැන නැගිය හැකි අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රගතිය හා බැදී සාමාන්‍ය දැනුම හා අධ්‍යාපනය නවීකරණය කිරීමේ ක්‍රියාකාරකම් පිළිබඳ සාමාන්‍ය දැනුම පරීක්ෂා කිරීමේ බහුවරණ හා කොටි පිළිතුරු සැපයීමට පහසු වන ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලට පිළිතුරු සැපයිය යුතුයි. | පැය 01 | 100 |

**සටහන :-**

මෙය තරග විභාගයක් වන බැවින් පත්වීම් ලැබීමට සුදුසුකම් ලබන්නේ එක් ප්‍රශ්න පත්‍රයකට වෙන් කර ඇති ලකුණු ප්‍රමාණයෙන් අවම වශයෙන් ලකුණු හතලික ප්‍රතිශතයක් (40%) ලබාගතහොත් පමණක් බව සැලකිල්ලට ගත යුතුයි.

### 11.2 ප්‍රායෝගික පරීක්ෂණය

ලිඛිත විභාගයෙන් සමත් වූ අයදුම්කරුවන් විසින්ම හඳුනාගත් මාතෘකාවක් යටතේ ප්‍රායෝගික පරීක්ෂණය ඉදිරිපත් කළ යුතුයි. මේ සඳහා පහත සඳහන් පරිදි ලකුණු ප්‍රදානය කෙරේ.

| ප්‍රායෝගික පරීක්ෂණයේදී ලකුණු ප්‍රදානය කරන සංසන්දනයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීමට අවශ්‍ය ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01. අරමුණ හා ප්‍රවේශය<br>**(Objective and the Approach)** | 05 | 02 |
| 02. නායකත්වය හා පරිපාලනය<br>**(Personality and Voice Control)** | 05 | 02 |
| 03. සන්නිවේදන උපාංග පිළිබඳ පැහැදිලි කිරීම<br>**(Clarity in the Communication)** | 05 | 02 |
| 04. කාල කරළමනාකරණය<br>**(Time Management)** | 05 | 02 |
| 05. ඉදිරිපත් කිරීමේ හැකියාව<br>**(Usage of Techniques of Presentation)** | 05 | 02 |
| **එකතුව** | **25** | **10** |

## 12. විභාග ප්‍රතිඵල :-

විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවයේ ලේකම්වරයා විසින් www.np.gov.lk යන උතුරු පළාත් සභාවේ අන්තර් ජාලය මගින් නිකුත් කරනු ලැබේ. ඉන් අනතුරුව විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් හට තැපැල් මගින් ප්‍රතිඵල යොමු කරනු ලැබේ.

**13.** **විභාග මධ්‍යස්ථාන :-**

විභාගය පැවැත්වීම අපේක්ෂා කරන විභාග නගර හා එම නගර අංක,

| *නගර* | *නගර අංක* |
|---|---|
| යාපනය | *01* |
| මන්නාරම | *02* |
| වවුනියාව | *03* |
| කිලිනොච්චිය | *04* |
| මුලතිව් | *05* |

විභාග මධ්‍යස්ථානයක් සඳහා යොමු වෙන අයදුම්පත් ප්‍රමාණය අඩුනම් එම විභාග කටයුතු ආසන්නතම විභාග මධ්‍යස්ථානයට මාරු කරනු ලැබේ.

**14.** මෙම විභාගය පැවැත්වීම හෝ අවලංගු කිරීම සම්බන්ධයෙන් වූ බලතල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරයා සතුය. මෙම නිවේදනය දෙමළ හා සිංහල යන භාෂා මාධ්‍යයන් මගින් පළ කරන අතර භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පැන නගින අවස්ථාවක් වෙතොත් එම අවස්ථාවේදී දෙමළ මාධ්‍යයේ නිවේදනය පරිදි කටයුතු කළ යුතුයි.

**S. තිරුවාකරන්.**
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.
*05.07.2021*